# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2020 ජූනි

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2020 ජූනි මාසයේ ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය (Headline Inflation) 6.3%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. පසුගිය මැයි මාසයේ මතුපිට උද්ධමනය 5.2%ක් ලෙස වාර්තා විය. 2020 ජූනි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 5.8%ක හා ආහාර නොවන කාණ්ඩයේ 0.5%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2019 ජූනි මාසයේ 2.1% ක්වූ මතුපිට උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය -1.3%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 3.4%ක් විය. 2019 ජූනි මාසයට සාපේක්ෂව 2020 ජූනි මාසයේ ආහාර කාණ්ඩයේ ප්‍රතිශතය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පොල්, සහල්, පොල්තෙල්, අළුත් මාළු, සීනි සහ කහ කුඩු යන ආහාර ද්‍රව්‍යවල පැවති ඉහළ මිල මට්ටම් ය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2020 මැයි මාසයේ 135.4ක් වූ දර්ශකාංකය 2020 ජූනි මාසයේ 137.3ක් දක්වා ඉහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2020 ජූනි මාසයේ දර්ශකාංකය 1.9ක වැඩිවීමක් එනම් 1.4ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 1.38% කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 0.03%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකුවිට එළවළු, සීනි, අළුත් මාළු, බිත්තර, සහල්, කහ කුඩු, කුකුල් මස්, අර්තාපල්, පොල්තෙල්, දෙහි, මයිසූර් පරිප්පු, පළතුරු, බිස්කට්, පොල්, මුං ඇට, පපඩම්, කව්පි සහ ටින් මාළු යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා වී ඇත. එසේ වුවත් සුදු ළූණු, කරවල, වියළි මිරිස්, දෙල්, මිරිස් කුඩු සහ තුනපහ කුඩු යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා විය.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2020 ජූනි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා ‘රෙදිපිළි හා පාවහන්', 'සෞඛ්‍ය', 'ප්‍රවාහන' (වාහන මිළදී ගැනීම), සහ 'ආපනශාලා සහ හෝටල්' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල වැඩිවීම බලපා ඇත. කෙසේ වෙතත් ‘මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' (බුලත්) සහ 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' (ගොඩනැගිලි ද්‍රව්‍ය) යන කාණ්ඩවල මිල අඩුවීමක් වාර්තා වී ඇත. තවද පසුගිය මාසය හා සංසන්දනය කලවිට, ‘ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' කාණ්ඩයේ සුළු වැඩිවීමක් වාර්තා වී ඇති අතර, 'විනෝදාත්මක හා සංස්කෘතික' සහ ‘විවිධ භාණ්ඩ හා සේවා' යන කාණ්ඩවල සුළු අඩුවීමක් වාර්තා වී ඇත. එහෙත්, පසුගිය මාසය හා සංසන්දනය කළවිට 'සන්නිවේදන' සහ ‘අධ්‍යාපන’ යන කාණ්ඩවල මිල දර්ශක අගය වෙනසක් වී නොමැත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යාමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිඹිබු වන යටිදැරි උද්ධමනය (Core Inflation) 2020 මැයි මාසයේ 3.7% සිට 2020 ජූනි මාසයේ 4.4% දක්වා වැඩිවීමක් වාර්තා විය.

**ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම: 2013=100), ජාතික පාරිභෝගික මිල දර්ශකය (යටිදැරි), ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සහ ලක්ෂ්‍යමය යටිදැරි උද්ධමනයේ විචලනය**




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) |
| **2019** | ජුනි | 129.2 | 133.0 | 0.4 | 0.0 | 2.1 | 6.1 |
| | ජූලි | 129.4 | 133.4 | 0.2 | 0.3 | 2.2 | 6.1 |
| | අගෝ. | 129.7 | 133.7 | 0.2 | 0.2 | 3.4 | 5.9 |
| | සැප්. | 130.6 | 134.0 | 0.7 | 0.2 | 5.0 | 5.6 |
| | ඔක්. | 131.9 | 134.4 | 1.0 | 0.3 | 5.6 | 5.6 |
| | නොවැ. | 132.9 | 134.6 | 0.8 | 0.1 | 4.1 | 5.5 |
| | දෙසැ. | 135.0 | 134.2 | 1.6 | -0.3 | 6.2 | 5.2 |
| **2020** | ජන. | 137.0 | 135.3 | 1.5 | 0.8 | 7.6 | 3.9 |
| | පෙබ. | 137.0 | 135.8 | 0.0 | 0.4 | 8.1 | 3.4 |
| | මාර්තු | 135.2 | 136.0 | -1.3 | 0.1 | 7.0 | 3.2 |
| | අප්‍රේල් | 134.8 | 136.9 | -0.3 | 0.7 | 5.9 | 3.2 |
| | මැයි | 135.4 | 137.9 | 0.4 | 0.7 | 5.2 | 3.7 |
| | ජුනි | 137.3 | 138.9 | 1.4 | 0.7 | 6.3 | 4.4 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව